## යුරෝපීය නොවන විදේශීය පුරවැසියන් සඳහා තොරතුරු, පදිංචිය සහතික කිරීම්, අවලංගු කිරීම් සහතික නිකුත් කිරීම.

### ලියාපදිංචි කිරීමේ ලේඛනය (පදිංචිය)

අයදුම්පත්‍ර ආකෘතිය අවු : 18 ට වැඩි සියලුම පුද්ගලයින් අත්සන් කළ යුතුය.

ඔබ වෙනත් ඉතාලියානු නගර සභාවකින් පැමිණි විට, අයදුම්පත්‍රයේ ආරම්භයේ දී නගර සභාවේ නම ලිවීම වැදගත් වේ.

පදිංචිය ඉල්ලුම් කරන සියලු දෙනාගේම පදිංචි බලපත්‍රයේ ඡායා පිටපතක් රැගෙන ආ යුතුය.

- අලුත් කිරීම සඳහා භාර දී ඇත්නම් එහි ඡායා පිටපතක්.
- පළමු වතාවට අයදුම් කළ අයකු නම්,
  - ආගමන කටයුතු සඳහා තනි ඒකකය (MOD 209) ඉදිරිපත් කරන රැකියා හෝ පවුල් හේතූන් සඳහා පදිංචි බලපත්‍රය නිකුත් කිරීමේ ඡායා පිටපතක්.
  - ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක්.

විවාහ සහතිකයේ පිටපතක් හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් පරිවර්තනය කර නීත්‍යානුකූල කර, යුරෝපීය පුරවැසියන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා අනිවාර්යය වේ.අනෙක් අය සඳහා අනිවාර්යය නොවේ.විවාහක භාවය යාවත්කාලීන කිරීමට අවශ්‍ය වේ.

### පෞද්ගලික දත්ත අවලංගු කිරීම. – (පදිංචිය) නේවාසික රැඳවුම් ප්‍රකාශය අලුත් කිරීම.

අලුත් කරන ලද පදිංචි බලපත්‍රයේ ඡායා පිටපතක් කල් ඉකුත් වී මාස 6ක් ඇතුලත නගර සභවේ රෙජිස්ටාර් කාර්යාලයට (ufficio anagrafe) ඉදිරිපත් කල යුතුය.

පදිංචි බලපත්‍රය කල් ඉකුත් වී මාස 6 කට පසු, රෙජිස්ටාර් කාර්යාලය නිවසට ලිපියක් එවා අලුත් කරන ලද නේවාසික රැඳවුම් පත්‍රයේ ඡායා පිටපතක් රැගෙන එන ලෙස දැනුම් දෙයි.

විදේශීය පුරවැසියකු දින 30 ක් ඇතුලත ලියවිල්ල් හෝ අලුත් කිරීමේ ලදුපත භාර නොදුන්නේ නම්, රෙජිස්ටාර් කාර්යාලයට ඔබගේ පදිංචිය අවලංගු කිරීමට බලතල ඇත.

**සහතික නිකුත් කිරීම.**

පොලිස් මුලස්ථානය සහ ප්‍රාන්ත ඇතුළු රජයේ කාර්යාලය සඳහා පදිංචි සහතික හා පවුලේ තත්ත්වය (stato di famiglia e certificate di residenza) නිකුත් කළ නොහැක.

සිවිල් අයිතිවාසිකම් සහතික කළ හැකිය.(විවාහ, උපත් මරණ) විදේශීය පුරවැසියන්ට ඉතාලිය ඇතුලත විවාහක හෝ උපත ලබා ඇත්නම් පමණි.